## කයිට්ස් ප්‍රාදේශීය සභාව

## යාපනය දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කයිට්ස් ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කයිට්ස් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතයවේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1:3:1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව්කර නොතිබුණි.

#### 1.3.2 ගණුම්කරණ අඩුපාඩු

වගකීම් හා වියදම් වලට අදාළව ගිණුම් වල නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු අවස්ථා ගණන හා වටිනාකම යටතේ පහත වගුවෙහි දැක්වේ.

| | වගකීම් | | වියදම් | |
|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. |
| ගිණුම්වල වැඩියෙන් දැක්වීම් | 02 | 1,391,945 | 01 | 1,750,000 |
| ගිණුම්වල අඩුවෙන් දැක්වීම් | 01 | 3,776,909 | - | - |

1.3:3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.76,485 ක් විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**විගණනයට තොරතුරු ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.52,875,046 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1:3:5 අනුකූල නොවීම්**

විගණනයේදී පහත දැක්වෙන නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ විධිවිධාන වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 103 | පසුගිය වර්ෂ දෙක තුළ නැති වූ රු.413,519 ක් වූ විදුලි උපකරණ පිළිබඳව සභාව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,541,737 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,420,741 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2:2:1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපති විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 02 | - | 143 | 02 | - | 143 |
| බදු කුලී | 1,272 | 1,448 | 60 | 1,065 | 1,186 | 60 |
| බලපත්‍ර ගාස්තු | 116 | 205 | - | 116 | 84 | - |
| වෙනත් ආදායම් | 20,623 | 16,671 | 60 | 4,062 | 16,180 | 60 |

### 2:2:2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කරන ලද උසාවි දඩ මුදල් සභාවට ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළ දඩ මුදල් උපලේඛනද සභාවට ලැබී නොතිබුණි.

### 2:2:3 මුද්දර ගාස්තු

2010 වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.4 හිඟ ආදායම්

1988 ප්‍රාදේශීය සභා ( මුල්‍ය හා පරිපාලන ) රීති ප්‍රකාරව කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු 2010 දෙසැම්බර් 31 දින දක්වා හිඟ වරිපනම් බදු , බදු කුලී හා බලපත්‍ර ගාස්තු රු.263,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත සහ තථ්‍ය වියදම හා විචලනයන් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පුනරාවර්තන වියදම** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 16,021 | 12,982 | 3,039 | 15,180 | 12,770 | 2,410 |
| අනෙකුත් | 2,620 | 3,800 | (1,180) | 4,195 | 2,260 | 1,935 |
| උප එකතුව | 18,641 | 16,782 | 1,859 | 19,375 | 15,030 | 4,345 |
| ප්‍රාග්ධන වියදම් | 6,452 | 10,192 | (3,740) | 3,205 | 5,913 | (2,708) |
| මුළු එකතුව | 25,093 | 26,974 | (1,881) | 22,580 | 20,943 | 1,637 |

### 2.4 මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණි | 03 | 01 |
| ද්විතීයික ශ්‍රේණි | 20 | 14 |
| ප්‍රාථමික ශ්‍රේණි | 48 | 35 |
| වෙනත් ( අනියම් / තාවකාලික ) | - | 03 |
| එකතුව | 71 | 53 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

පහත විගහ කර ඇති භෞතික සම්පත් නිෂ්කාර්ය හා ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| වත්කමේ ස්වභාවය | වටිනාකම<br>රු. | නිෂ්කාර්යව පැවති කාලය |
|---|---|---|
| අනලයිතිවු මාළු වෙළඳපල | 450,000 | වර්ෂ 1 ක් |
| එලුවයිතිවු මාළු වෙළඳපල | 240,000 | වර්ෂ 1 ක් |
| 252-6481 දරන පික්අප් රථය | 1,242,500 | වර්ෂ 1 ක් |
| | 1,932,500 | |

### 2.5.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු.7,801,988 ක් වු අතර , වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ රු.2,221,685 ක් විය.

### 2.5.3 අයවිය යුතු සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය ශේෂවල එකතුව රු.2,179,763 ක් වු අතර, වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවා අයවීම් හිඟහිට පැවති ගිණුම් ශේෂ රු.2,033,827 ක් විය.

### 2.5.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා 2000 නොවැම්බර් 22 දනැති අංක 1159/22 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව ගව ඝාතක ස්ථාන සඳහා බලපත්‍ර ලබාගෙන නොතිබුණි. ගව ඝාතක පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඝාතනය කරන ලද ගවයින් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලේඛනගත කර නොතිබුණි.

### 2.5.5 කාර්ය සාධනය

-------------------

වාර්ෂික ක්‍රියාකාර් සැලැස්මක් ගිණුම් වර්ෂය ආරම්භයේදී සභාව විසින් පිළියෙල කර නොතිබුණි. එබැවින් ඉටුකර ගත යුතු අපේක්ෂිත අරමුණු හා ඒ පිළිබඳ ප්‍රගතිය තහවුරු කර ගත නොහැකි විය.

### 2.6 අභ්‍යන්තර විගණනය

-----------------------

සභාවෙහි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). ගිණුම්කරණය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). වත්කම් කළමනාකරණය

(ඈ). මෝටර් වාහන පාලනය

(ඉ) ආපසු ගෙවිය යුතු තැන්පතු